**ආණමඩුව ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආණමඩුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 දෙසැම්බර් 09 දින රු.6,300,000කට මිලදීගත් සභාවට අයත් කැබ් රථයක් 2022 මැයි 09 දින සිදු වූ අනතුරකදී පූර්ණ අලාභයකට පත්ව තිබූ අතර එම කැබ් රථයේ වටිනාකම ස්ථාවර වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැළපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ට්‍රැක්ටර් රථයේ වටිනාකම රු.650,000ක් වුවත් එය රු.6,500,000ක ලෙස වැඩියෙන් සටහන් කිරීමත්, රු.620,000ක වතුර බවුසරයක් මෝටර් රථ ගිණුමින් අත් හැරීමත් හේතුවෙන් මෝටර් රථ ගිණුම රු.5,230,000කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුම සැකසීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇති බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ රු.158,010ක කොම්පෝස්ට් අවසන් තොගයත් වර්ෂය තුළ නිෂ්පාදිත රු.461,100ක තොගයත් වශයෙන් රු.619,110ක් ප්‍රාග්ධන යෙදුමින් ආදායමට දායක වීමේ ගිණුමට බැර කර තිබුණි. | 2024 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිමෙන්ති බෑග් 100ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීමට තිබූ රු.190,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියලුම ගෙවිය යුතු දෑ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ණයහිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ජෙත්තුකුලම වැව මාර්ගයේ ඉතිරි කොටස් කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීමට අදාළ කර්මාන්තයේ ණයහිමි වටිනාකම රු.384,554ක් වුවත් රු.210,446ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු.136,250ක් වටිනාකමැති භාණ්ඩ වත්කම් යටතේ ගිණුම් ගත නොකිරීමෙන් එම වටිනාකමින් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුම සැකසීමේදී අවසන් තොගයට එකතු කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඌ) | ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය හා ස්ථාවර වත්කම් ශේෂය එකිනෙකට සමාන විය යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දිනට එම ගිණුම් අතර රු.3,587,438ක වෙනසක් විය. | 2024 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂ අතර වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **නොසැපයූ විගණන සාක්ෂි** | **ලේකම්ගේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.136,649,669ක් වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂවල ගිණුම් සැකසීමේදී මේ සඳහා උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල අයිතිය හා වටිනාකම තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **ලේකම්ගේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 104(4) හා 105(1) වගන්ති | සභාවට අයත් කැබ් රථයක් 2021 ඔක්තෝබර් 18 දින ත්‍රී රෝද රථයක ගැටීම හේතුවෙන් හානියට පත් වී තිබූ අතර, මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට දක්වා තිබුණද මූලික පරීක්ෂණය පවත්වා රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද සභාවට අයත් බැකෝ යන්ත්‍රය 2021 ජූලි 19 දින අනතුරට භාජනය වී තිබූ අතර අනතුර සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ වාර්තාව අපවෙත ලැබී නොමැති අතර, එය ලබාගත් පසු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 371(2) (ආ) හා මු.රෙ. 371(5) වගන්ති | ලබාගන්නා තත්කාර්ය අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය අවසන් කර දින 10ක් තුළ පියවිය යුතු වුවත් අවස්ථා 07කදී රු.168,991ක අත්තිකාරම් ලබා ගැනීම් පියවීම සඳහා සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. | ඉදිරියට නියමිත දිනයට අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු සිදුකරන බව. | - එම - |
| (iii) | මු.රෙ. 571(2) වගන්තිය | වසර 02ක් ඉක්මවූ වටිනාකම රු.1,098,046ක තැන්පතු 69ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571(2) අනුව කටයුතු කරන බව. | - එම - |
| (ආ) | 2013 අංක 01 දරණ ප්‍රජාමූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය | ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කරවීම හා අධීක්ෂණය එම ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට පවරා දී තිබුණු නමුත් බල ප්‍රදේශයේ ස්ථාපිත ප්‍රජාමූල සංවිධාන අතරින් 60ක් වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයේ ලියාපදිංචි කරවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචිය හා අධීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කරන බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,202,297ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,208,534ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 5,037 | 4,924 | 1,685 | 12,937 | 5,682 | 6,207 | 3,027 | 14,481 |
| කුලී | 21,094 | 21,354 | 20,628 | 1,291 | 18,595 | 17,693 | 16,605 | 1,751 |
| බලපත්‍ර ගාස්තු | 1,805 | 1,843 | 1,843 | - | 605 | 534 | 534 | - |
| වෙනත් ආදායම් | 81,210 | 6,409 | 6,409 | - | 10,211 | 22,063 | 22,063 | - |
| එකතුව | 109,146 | 34,530 | 30,565 | 14,228 | 35,093 | 46,497 | 42,229 | 16,232 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.12,514,444ක්, සහ කුලී රු.1,291,427ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.5,217,108ක් වූ උසාවි දඩ සහ රු.26,971,631ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. ඉන් වර්ෂ 01ට අඩු උසාවි දඩ රු.5,217,108ක්ද වර්ෂ 01ට වැඩි 03ට අඩු මුද්දර ගාස්තු රු.26,971,631ක්ද වශයෙන් හිඟ ශේෂ දක්නට ලැබුණි. | ලැබිය යුතු මුළු මුදලම අයකර ගැනීමට ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත වාර්තා යවා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආණමඩුව බස්නැවතුම්පළ ඉහළ මාලයේ ඇති ශාලා අංක 02 කඩ කාමරය, කාමර දෙකක් ලෙසට වෙන් කිරීම සඳහා 2023 ජනවාරි 12 පැවති මහා සභා රැස්වීමේදී තීරණය කර තිබුණද එම මහා සභා තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් රු.480,000ක අවම ලංසු මුදලවත් සභාවට ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | 2023 ජනවාරි 12 දින ගත් තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදු කරමින් පවතින බව. | මහා සභා තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.47,142,541ක් වූ අතර එය තුල වර්ෂ 05ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.5,418,021ක් විය. | හිඟ මුදල් කඩිනමින් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.16,919,014ක් වූ අතර එය තුල වර්ෂ 05ක් ඉක්මවූ ශේෂවල වටිනාකම රු.1,025,229ක් විය. | හිඟ මුදල් කඩිනමින් පියවීමට කටයුතු කරන බව. | ණයහිමියන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිශ්කායර් හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදන මත රු.1,455,077ක් වැය කරමින් ඉදිකළ සුරක්කුලම ක්‍රීඩාපිටිය පිළිබඳව 2023 ඔක්තෝබර් 19 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී කැළෑවෙන් හා තණකොළවලින් වැසී තිබුණි. | අදාළ ක්‍රීඩා සමාජයන් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු සිදුකර ඇති බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන මත රු.300,000ක් වැය කරමින් ඉදිකළ ආණමඩුව තලාකොළවැව අත්පන්දු ක්‍රීඩාංගනය භාවිතා නොකිරීම හේතුවෙන් කැළෑවෙන් හා තණකොළවලින් වැසී තිබුණි. | අදාළ ක්‍රීඩා සමාජයන් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු සිදුකර ඇති බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ආණමඩුව මහකුඹුක්කඩවල කිවුල් දියසෙන් ජල ව්‍යාපෘතිය රු.1,133,304ක් වැයකර ඉදිකර තිබුණි. 2023 ඔක්තෝබර් 19 දින වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 04කට ආසන්න කාලයක් ගත වී තිබුණද ජලය ලබාදීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ජල ව්‍යාපෘතියේ වැඩ කටයුතු නිමකර අදාල ජල පරිභෝගිකයන්ට ජලය සැපයීමට කටයුතු කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඈ) | 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (ප්‍රජා ජල සම්පාදනය) යටතේ ආණමඩුව කම්මන්දළුව ගල්කුලම ජල ව්‍යාපෘතිය රු.4,196,835ක් වැය කර ඉදිකර තිබුණි. 2023 ඔක්තෝබර් 19 දින වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05කට ආසන්න කාලයක් ගත වී තිබුණද එමඟින් ජලය ලබාදීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරියෙකුගේ පරීක්ෂාවකින් පසුව ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේදී උණ්ඩියංකුලම ජල පිරිපහදු කිරීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර 2023 ඔක්තෝබර් 19 වන විටත් මෙමඟින් ජලය පිරිපහදු කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ඉදිරියේදී සමිති දැනුවත් කර අදාළ පිරිපහදු කිරීමේ කටයුතු කිරීමට අදාළ කටයුතු සිදු කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් හා සභාව විසින් භුක්ති විඳින, පාලනය හා නඩත්තු කෙරෙන ක්‍රීඩාපිටි, ප්‍රජා ශාලා, සතිපොළ, පුස්තකාල 16ක හා වාහනයක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි හි 8.9.1 (ආ) ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් 2022 වර්ෂයේ අවස්ථා 02කදී රු.5,216,700ක් වැයකර අළුත්වැඩියා කරන ලද වාහන සඳහා එපරිදි ගිවිසුම් ගත වී නොතිබුණි. | ඉදිරියේදි වාහන පූර්ණ අළුත්වැඩියා කටයුතු සිදුකිරීමේදි කොන්ත්‍රාත් ගිවිසුමක් මගින් ආයතනය හා සම්බන්ධ වන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ ද්වීතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 10ක්ද අතිරික්තතා 19ක්ද ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 15ක් හා අතිරික්තතා 13ක්ද පැවතුණි. | සභාවේ පවතින සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හදුනාගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැඩ තහනමට ලක්වූ සේවකයෙකුගෙන් හා විශ්‍රාම ගිය සේවකයෙකුගෙන් පිළිවෙලින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.2,500ක හා රු.9,441ක එකතු වටිනාකම රු.11,941ක් වූ ණය ශේෂ අය නොවී පැවතුණි. | සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති අතර ඉදිරියේදී ණය අයකර ගැනීමට කටයුතු කරන බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 08ක් ඉටු කිරීම සඳහා රු.466,627ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | ඉදිරියේදී භෞතික ප්‍රගතිය මෙන්ම මූල්‍ය ප්‍රගතියද උපරිම මට්ටමින් ලගාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අභ්‍යන්තර විගණනය විසින් කර්මාන්ත පරීක්ෂාව, පුස්තකාල පරීක්ෂාව හා වීථිපහන් සවි කිරීම්, ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම වැනි ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය පෙර වර්ෂවලට වඩා වැඩි විෂය ක්ෂේත්‍රයක් ආවරනය වන පරිදි කිරිමට කටයුතු කරන බව. | ආයතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 11ක් සඳහා සලසාගෙන තිබුණු රු.350,000ක් වූ ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | 2024 වර්ෂයේ භෞතික ප්‍රගතිය මෙන්ම මූල්‍ය ප්‍රගතියද උපරිම මට්ටම ලගා කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ආ) | තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11ක් සඳහා සලසාගෙන තිබුණු රු. 2,104,452ක් වූ ප්‍රතිපාදිත මුදලින් සියයට 50 සිට සියයට 90 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | එම | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |

**4.4 තිරසාර සංවධර්න අරමුණු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 10ක් හඳුනාගෙන එම අරමුණු ළඟා කර ගැනීමේ ක්‍රියාකාරකම් 41ක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් 39ක ප්‍රගතිය කරා ළගා නොවීම සියයට 21 ක සිට සියයට 98 ක දක්වා පරාසයක පැවතුණි. | 2024 වසරේ දී අපේක්ෂිත ප්‍රගතිය කර ලගා වීමට හැකි උපරිම මට්ටමින් කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |